සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ප්‍රාථමික අංශය
සැකසුම ~ W.D.G.M. ටිකිරි සිරි කුමාරි
ගුරු උපදේශක
දෙහිඕවිට අධ්‍යාපන කලාපය

දයාබර දූ දරුවනි,දෙමාපියනි.

මෙම ව්‍යසනකාරී අවස්ථාවේදී ඔබේත් රටේත් ආරක්ෂාව සඳහා නිවෙස් තුළම රැඳී සිටින දූ දරුවන්ට තම අධ්‍යාපන කටයුතු සඳහා යොමුවීමට අත්වැලක් ලෙස මෙම ක්‍රියාකාරකම් ඉදිරිපත් කරමි. ඔබ සැමට සුවදායක දිවියකට ආසිරි පතමි.

5 ශ්‍රේණිය සිසු දරුවන්ට,

මම යෙදුණු වාක්‍ය මතක් කර ගනිමු.

1) පහත දී ඇති වාක්‍ය කියවමු.

- මම සබන් යොදා දෑත් සෝදමි.
- මම විවිධ වර්ගයේ පැළ සිටුවමි.
- මම උදෑසනින් අවදි වෙමි.

- මම අන් අයට උදවු කරමි.

2)මෙම වාක්‍යවලට සුදුසු අතීත කාල ක්‍රියාපද තෝරා ලියමු.

- මම වැඩිහිටියන්ගේ අවවාද _____
- මම පිරිසිදු ඇදුම්_____
- මම නිසි පරිදි කසළ බැහැර _____
- මම සතුටින් ජීවත් _____

(ඇන්දෙමි, පිළිපැද්දෙමි, වූයෙමි, කළෙමි)

අපි යෙදුණු වාක්‍ය අතීත කාල වාක්‍ය උගනිමු .

- ”අපි මෙවර නිවාඩු කාලය නිවසටම වී ගත කරමු.” යැයි අම්මා පැවසූවාය. අපි පොත් පාඩම් කිරීමට නිවාඩු කාලය යොදා ගත්තෙමු. ”අපි සෙල්ලම් කරමු.” මල්ලී පැවසූවේය. අපි බට්ට පැන්නෙමු. ක්‍රීඩාව නිමා කළ අපි හොඳින් පිරිසිදු වූයෙමු. අපි සතුටින් කාල ගත කළෙමු.

1) ඉහත දී ඇති කොටසින් 'අපි' යෙදුණු අතීත කාල වාක්‍ය තෝරා ලියන්න.

2) එම වාක්‍ය වල ක්‍රියාපද යටින් ඉරක් අඳින්න.